**හික්කඩුව නගර සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 නොවැම්බර් 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට හික්කඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

ඉකුත් වර්ෂයේ මුද්දර ගාස්තු වෙනුවෙන් ඌන වෙන් කිරීම් රු.174,167 ක් සම්බන්ධයෙන් ගිණුම් තබා නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**
**-------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.77,430,336 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.29,773,805 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
**-----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.160,795 ක් වූ සභාවේ පෙර ගෙවුම් හා අත්තිකාරම් ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ නාරිගම පතන මාර්ගයේ පාලම ඉදිකිරීම කර්මාන්තය වෙනුවෙන් ලැබිය යුතු රු.789,164 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා 2004 වර්ෂයේ දී දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් රු.15,576,729 ක් වූ ණය මුදල නිරවුල් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සභාවේ කර්මාන්ත 04 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.2,061,259 ක ණය මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.98,116,648 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා විධිමත් උපලේඛන ද, රු.4,341,718 ක් වූ ස්ථාවර තැන්පත් සඳහා ස්ථාවර තැන්පත් ලේඛනය ද, රු.12,730,877 ක් වූ බැංකු මුදල් සඳහා ශේෂ තහවුරු ලිපි ද, රු.11,093,588 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් සඳහා යාවත්කාලීන කරන ලද තැන්පත් ලේඛනය හා උපලේඛන ද, රු.16,981,982 ක් වූ දේශීය ණය සංවර්ධන අරමුදල් සඳහා යාවත්කාලීන කරන ලද ණය ලේඛනය ද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.1,472,216 ක තැන්පතු වර්ග 11 ක ශේෂ නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) අංක 41/90 දරන 1990 ඔක්තෝබර්10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 31 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.24,438,894 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.18,224,786 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,214,108 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම්

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හිඟ වරිපනම් ශේෂය රු.24,235,904 ක් වූ අතර, එම මුදල් අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170(2) වගන්තිය පරිදි විධිමත් වැඩපිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කිරීම කෙරෙහි නගර සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

### 2.2.2 බදු කුලී

සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.4,646,770 ක් වූ හිඟ බදු කුලී අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170(අ)(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බලපත්‍ර ගාස්තු රු.540,074 ක් විය. හිඟ මුදල් අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170(අ)(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.33,022,548 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.1,600,000 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ) සේවක ණය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.51,300 ක මුදලක් 2008 වර්ෂයේ සිට අයකර කර ගැනීමෙන් තොරව ඉදිරියට ගෙනෙමින් පැවැතුණි.

**(ආ) මානව සම්පත් කළමනාකරණය**

(i) මාණ්ඩලික අංශයේ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර සහ පෙර පාසල් ගුරු තනතුරු 06 ක් සඳහා අනුමත කර ගැනීමෙන් තොරව නිලධාරීන් බඳවාගෙන තිබූ අතර, ද්විතීයික අංශයේ සංවර්ධන නිලධාරී තනතුරක සහ ප්‍රාථමික අංශයේ තනතුරු 06 ක අතිරික්තයන් පැවැතුණි.

(ii) හික්කඩුව ආයුර්වේද මධ්‍යස්ථානයට අනුමත කර තිබුණු ඖෂධ සංයෝජක තනතුර සඳහා සේවකයෙකු බඳවා ගැනීමට 2002 වර්ෂයේ සිට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(iii) සභාවේ කළමනාකාර සහකාර තනතුරු 04 ක වැඩ ආවරණය සඳහා කාර්යාල කාර්ය සහායකයින් යොදවා තිබුණි.

(iv) එක් ආදායම් පරීක්ෂකවරයෙකුගේ පෞද්ගලික ලිපිගොනුව නගර සභාවේ නොතිබුණු අතර, විධිමත් ස්ථාන මාරු ක්‍රමයක් නොතිබීමෙන් කළමනාකරණ සහකාරවරයෙකු වසර 13 ක් හා ආදායම් පරීක්ෂවරයෙකු වසර 09 ක් අඛණ්ඩව සභාවේ සේවය කර තිබුණි.

(ඇ) අනුමැතියකින් තොරව බඳවාගෙන ඇති සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා සභාවේ ආදායමින් රු.2,718,047 ක් වැය කිරීමට සිදුව තිබුණි.

(ඈ) සභාව විසින් පාවිච්චි කරන වාහන 14 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

වලමුල්ල ආදාහනාගාර II වන අදියර සඳහා රු.12,938,594 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් විසින් දකුණු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත භාර දී තිබුණ ද, 2017 අගෝස්තු 23 දින වනවිටත් II වන අදියරේ වැඩ ආරම්භ කර නොතිබුණු අතර, සභාව මේ සඳහා අවධානය යොමුකර ආදාහනාගාරයේ වැඩ අවසන් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) රෝද 04 ට්‍රැක්ටර් 03 ක්, ට්‍රේලර් 02 ක් සහ බැකෝලෝඩර් රථයක් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ ආධාර වශයෙන් ලැබී තිබූ රු.7,967,144 ක් වටිනාකම වූ පොටොන් කම්පන මාර්ග තලනය හා 2016 වර්ෂයේ දී ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය මඟින් ලබා තිබූ රු.3,000,000 ක් වටිනාකම වූ ගලිබවුසරය කිසිදු කාර්යයක් සඳහා යොදා ගැනීමකින් තොරව පැවතුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 07 ක එකතුව රු.26,112,414 ක් වූ ඉතිරිවීම් ද, තවත් විෂයයන් 02 ක රු.1,512,744 ක් වූ අහිතකර විචලනයන් ද, ආදායම් විෂයයන් 06 ක එකතුව රු.16,278,476 ක් වූ ළඟාකර නොගත් ඉලක්ක ආදායම් ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති දපපා/යහ/01/න.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. සභාව විසින් අභ්‍යන්තර විගණන නිලධාරියෙකු ලෙස සංවර්ධන නිලධාරියෙකු පත්කර තිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4.4 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

ඉකුත් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ 2.2.6(අ) (i), (ii), (iii), 2.2.6(ඇ), 4.3(ඇ), 5.4(ii), 5.7 දක්වා පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීමට එකඟ වී ඇති නමුත්, සමාලෝචිත වර්ෂයේදී ත් අදාළ නිවැරදි කිරීම් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | මූල්‍ය ප්‍රකාශන සමඟ උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. |
| | | (ii) | නොවෙනස්ව ඉදිරියට එන ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| | | (iii) | සමාලෝචිත වර්ෂය තුළ මිලට ගත් ස්ථාවර වත්කම් ලේඛන ගතකර නොතිබුණි. |
| (ආ) | වාහන පාලනය | (i) | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | සභාව සතු වාහන 31 න් වාහන 13 ක් උපයෝජනයකින් තොරව පැවැතුණි. |
| | | (iii) | නිෂ්ක්‍රීය වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | (iv) | කිසිදු ධාවනයකින් තොරව පවතින වාහන 02 ක් සම්බන්ධයෙන් සුදුසු කටයුත්තක් කර නොතිබුණි. |
| (ඈ) | අයවැය පාලනය | (i) | වියදම් විෂයයන් 07 ක ඉතිරිවීම් දක්නට ලැබුණි. |
| | | (ii) | ආදායම් විෂයයන් 06 ක අහිතකර විචලනයන් දක්නට ලැබුණි. |
| (ඇ) | ලේඛන නඩත්තු කිරීම | (i) | හානි පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. |
| | | (iii) | ප්‍රාග්ධන ආධාර සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (iv) | තැන්පත් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | (i) | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීමට මෙන්ම අතිරික්ත කාර්යය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | සභාවේ සේවය කළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (ii) | මුද්දර ගාස්තු ආදායම යාවත්කාලීනව අය කරගෙන නොතිබුණි. |
| | | (iii) | වර්ෂ කිහිපයක සිට එන එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |